**ධීවර අමාත්‍යාංශය සහ විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය**

# ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය (NAQDA)

# ඇබෑර්තු

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියෙහි (NAQDA) පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | වැටුප් කේතය | ඇබෑර්තු ගණන | සේවා ස්ථානය | වැටුප් පරිමාණය - රුපියල් - |
|---|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | HM 2 - 2 2016 | 01 | ප්‍රධාන කාර්යාලය, පැලවත්ත, බත්තරමුල්ල. | 91,645–12X2,700 – 124,045 |
| 02 | අධ්‍යක්ෂ (මුදල්) | HM 1 - 1 2016 | 01 | ප්‍රධාන කාර්යාලය, පැලවත්ත, බත්තරමුල්ල. | 81,670–15X2,270 – 115,720 |
| 03 | සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් සංවර්ධන) | MM 1 - 3 2016 | 01 | කලාවැව පුහුණු මධ්‍යස්ථානය | 55,925–10X1,375 – 15X1,910 – 98,325 |

## 01. අධ්‍යක්ෂ ජනරාල් තනතුර - HM 2-2

**සුදුසුකම් හා පළපුරුද්ද - බාහිර**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලනය හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**සහ**

විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් හෝ කළමනාකරණ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය

**සහ**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු, සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක සනාථ කළ සේවා වාර්තාවක් සමග වසර 05 ක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ පළපුරුද්දක් ඇතුළත්ව අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

**සහ**

විද්‍යා / කෘෂිකර්ම / ව්‍යාපාර පරිපාලන හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් (PhD) උපාධියක්

**සහ**

ප්‍රථම උපාධිය ලබාගත් පසු සංස්ථාවක, මණ්ඩලයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක කළමනාකරණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද සහිතව, සනාථ කළ සේවා වාර්තාවක් සමග ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තලයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

**සුදුසුකම් හා පළපුරුද්ද - අභ්‍යන්තර**

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක්

**සහ**

බහු ශික්ෂිත කණ්ඩායම්වලට නායකත්වය දීමේ හා දිශානති කිරීමේ සනාථකළ හැකියාව තිබිය යුතු අතර, මානව හා අනෙකුත් සම්පත් නිවැරදිව යෙදවීම හා කාර්යක්ෂම කළමනාකරණය කිරීම පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය.

## 02. අධ්‍යක්ෂ (මුදල්) තනතුර - HM 1-1

**සුදුසුකම් හා පළපුරුද්ද - බාහිර**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් කළමනාකරණ (මූල්‍ය) ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් හා පශ්චාත් (මාස්ටර්ස්) උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (කළමනාකරණ (මූල්‍ය) සමග අවම වශයෙන් වසර 15 ක, මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද.

**සුදුසුකම් හා පළපුරුද්ද - අභ්‍යන්තර**

අධිකාරියේ, "**කළමනාකරණ තලයේ**" (MM) I ශ්‍රේණියට අදාළව මූල්‍ය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

## 03. සහකාර අධ්‍යක්ෂ - මානව සම්පත් සංවර්ධන තනතුර - MM 1-3

**සුදුසුකම් හා පළපුරුද්ද - බාහිර**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කළමනාකරණ / මානව සම්පත් ක්ෂේත්‍රයේ උපාධියක් සමග රජයේ දෙපාර්තමේන්තුවක / ව්‍යවස්ථාපිත ආයතනයක හෝ ප්‍රසිද්ධ වෙළඳ ආයතනයක කළමනාකරණ තලයේ වසර එකක (01) පරිපාලන පළපුරුද්ද.

**සුදුසුකම් හා පළපුරුද්ද - අභ්‍යන්තර**

අධිකාරියේ මානව සම්පත් අංශයේ කනිෂ්ඨ කළමනාකරු (JM) මට්ටමේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්ද.

**පොදු කොන්දේසි :**

රාජ්‍ය සේවයේ / පළාත් පාලන රාජ්‍ය දෙපාර්තමේන්තුවල / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ.

- ✓ අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- ✓ අයදුම්කරුවන්, තනතුරට අදාළ රාජකාරී නියමාකාරයෙන් ඉටු කිරීමටත්, ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි අයුරු මනා ශාරීරික හා මානසික සුවතාවයකින් යුක්ත විය යුතුය.
- ✓ **අධ්‍යක්ෂ ජනරාල් හා මූල්‍ය අධ්‍යක්ෂ** : වයස අවුරුදු 35 ට නොඅඩු විය යුතු අතර, 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- ✓ **සහකාර අධ්‍යක්ෂ – මානව සම්පත් සංවර්ධන** : වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.
- ✓ විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- ✓ පත්කිරීම් ස්ථිර පදනමින් සිදු කෙරේ.

**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් ලබාදෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ.**

- ✓ වෛද්‍ය ප්‍රතිලාභ
- ✓ රජය විසින් අනුමත කරන ලද වෘත්තීය දීමනා හා අනෙකුත් දීමනා
- ✓ **අධ්‍යක්ෂ ජනරාල් හා මූල්‍ය අධ්‍යක්ෂ**

  දැනට පවත්නා රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ ප්‍රකාරව අධිකාරිය විසින් රියදුරු හා ඉන්ධන දීමනාව සහිත වාහනයක් හෝ ප්‍රවාහන දීමනාවක් ලබාදෙනු ලැබේ.
- ✓ සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාර අරමුදල්වල දායකත්වය

**ඉහත තනතුරු සඳහා අයදුම්පත් යොමු කරන විට පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කළ යුතුය.**

- ✓ ජීව දත්ත
- ✓ සුදුසුකම් හා පළපුරුද්ද සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල සහතික කළ ඡායා පිටපත්.

සම්පූර්ණ විස්තර ඇතුළත් අයදුම්පත්, අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුරු නාමය සඳහන් කොට, ලියාපදිංචි තැපෑලෙන් "**සභාපති, ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, අංක 41/1, නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල**" යන ලිපිනයට මෙම දැන්වීම පළවී දින 14 ඇතුළත ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය.**